# 1.4 ධම්පියා අටුවා ගැටපදයෙහි පැනෙන නිපාත පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක්

වි. මු. විජේරත්න
වාග්විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

---

## ABSTRACT

ධම්පියා අටුවා ගැටපදය ක්‍රි.ව. 10 වන සි.ව. දී රචනා වූ දැනට ශේෂව ඇති පැරැණිතම සිංහල කෘතියයි. සිංහල ප්‍රාකෘත යුගයෙන් පසු සිංහලය සංවර්ධනය වූ ආකාරය කෙබඳුදැයි සොයන්නකුට ධම්පියා අටුවා ගැටපදය අනර්ඝ නිධානයකි. මේ කෘතිය රචනා කිරීමේදී එහි කතුවරයා පාලි රීතිය ගුරු තන්හි තබාගත් බව පෙනේ. පාලි තත්සම හා අර්ධ තත්සම වචන මෙන්ම පාලියෙන් බිඳගත් භාෂාත්මක රූපද මෙහි බහුලය. මෙසේ සකස් කරගත් පද අතර නාම, ක්‍රියා මෙන්ම නිපාත ද දක්නා ලැබේ. ධම්පියා අටුවා ගැටපදයේ පැනෙන නිපාත පිළිබඳ වාග්විද්‍යාත්මක විග්‍රහයක් මේ ලිපියෙන් ඉදිරිපත් කෙරෙයි.

ධම්පියා අටුවා ගැටපදයේ දක්වෙන නිපාත පද ක්‍රම කිහිපයකට වර්ග කළ හැකියඃ

- අ. පාලි (සංස්කෘත) භාෂාවලින් තත්සම වශයෙන් ගනු ලැබූ නිපාත
- ආ. දායක භාෂා ඇසුරින් සාධිත නිපාත
- ඇ. නාම මූලයකින් ව්‍යුත්පන්න වූ නිපාත
- ඈ. කිසියම් ප්‍රාකෘතයක හෝ වෙනත් මූලාශ්‍රයක තිබූ පද පුන විග්‍රහ කිරීමෙන් නිපන් නිපාත
- ඉ. වෙනත් ක්‍රම මාර්ග මගින් සංවර්ධය වූ නිපාත

මේ නිපාතවල යෝජනයද විවිධාකාරය. අනෙක් සියලු පදවලදී මෙන්ම නිපාතවලද රූපාන්තර දක්නා ලැබෙන අතර නිපාත එකකට වැඩි ගණනක් එකට යෙදෙන අවස්ථාද දක්නා ලැබෙයි. භාෂාවක් සංවර්ධනයේදී භාෂා සම්පර්කයේ වැදගත්කමත්, දායක භාෂාවට අනුව සාධනය කරගත් පදවල හැසිරීමේ ස්වභාවයත් මෙහිදී විමසුමට ලක් කෙරේ. ප්‍රස්තුත භාෂා ස්වරූපය නිවැරැදිව වටහා ගැනීමටත්, භාෂා පරිණාමයේ රටා හඳුනා ගැනීමටත් මෙම අධ්‍යයනය ඉවහල් වෙයි.